

# 4. දෙවන පණ

එ දා රෑ පල් සොරු මුළක් ගෙයක් බිඳ, බඩු ගෙන සොහොන මැදින් යෙති. සමහරු බඩු මිටි හිසින් ගෙන යෙති. සමහරු මුදල් පසුම්බි ආදිය එල්ලා-ගෙන යෙත්. මෙ සේ යන එකෙක් සොහොනෙහි හොත් කිරි හාමි පයින් මැඩ-ගෙන ගියේ ය.

නිදා උන් කිරි හාමි පිබිද සොරුන් දැක, 'අනේ, මුන් ගේ නොහැදුණු කම! මළ එකකුට වත් නිකම් ඉන්නට අරින්නේ නෑ නො වෙයැ' යි කීයේ ය. සොරු ඒ අසා නැවැතී, ඒ කවරෙක් දැයි බැලූ හ. එකෙක් 'මේ කවුදැ' යි ඇසී ය.

'ඒ මම, කිරි හාමි. මා මළා. ඉතින් මළ එකා පාගා-ගෙන යෑම හරි ද?'

සොරුනට ද සිනා නො සී සිටීම අමාරු විය. 'මැරුණේ හැබෑවට ම ද බොරුවට දැ' යි අනෙකෙක් ඇසී ය.

'මෙන්න මූට පිස්සු. බොරුවටත් මැරීමෙක් ඇද්ද? බල, හාමුදුරුවන් කීවා "හිසත් පයත් එක සැටි සීතල වුණු දා මළා ය" කියා. ඊයේ මා ගඟේ වැටී හිසත් පයත් එක සැටි සීතල වුණා. ඉතින් මා මළේ නැද්ද?'

'මේ කුමන පිස්සෙක් ද? බිල්ලකට බොහොම අගෙයි. බොරු නැති ව එනවා යන්නට' යි සොර දෙටුවා කී ය.

'අනේ, මා මළා, මා මළා. මළ එකාට ඉන්නට දී යනවා යන දිසාවෙක්' යි කිරි හාමි අඬන්නට වූයේ ය. හොර මුළේ හිටි එකෙක් දෙන්නෙක් ද හොරට අඬන්නට වූ හ.

'අනේ, ඉතින් කවදා දකින්නට ද' යි එකෙක් ඇඬී ය. 'අනේ, මාත් ඉඳ-ලා කුමට ද' යි තවෙකෙක් ඇඬී ය. කිරි හාමි කිපී, 'තොපි යන යි අනෙක යවු. මළ එකාට කවට කම් කැර අපායට විතරක් යන්නට එපා' යි ගෙරෙවුවේ ය.

එක් සොරෙක් ඉදිරියට පැන, 'හා, හා, කවට කම් කරන්න එපා. හොඳ යැ? මොහු ඇත්තෙන් ම මැරී-ලා. මා දන්නවා හොඳ මන්ත්‍රයක් ගිය පණ ගෙන්වන. කැමැති නම් මතුරා බලන්නට පුළුවනි. හැබැයි, පණ එනවා නම් දකුණු පයේ මහ පට ඇඟිල්ලේ වේදනාවෙක් දනෙයි. මතුරා බලන්නට ද'යි කීයේ ය. කිරි හාමි ද මීට කැමැති විය.

හොරා ද පිහියෙකින් කිරි හාමි ගේ පයේ මහ පට ඇඟිල්ලට අතින ලෙස අනෙකකුට කියා මතුරන්නට විය. 'ඕං නමො ගිය පණ වරෙන්, ගිය පණ වරෙන්, ගිය පණ වරෙන්, ස්වාහා' යි මතුරනු සමඟ ම කිරි හාමි ගේ දකුණු පයේ මහ පට ඇඟිල්ලේ මහත් වේදනාවෙක් වී ය. 'පණ ආවා, පණ ආවා' යි මහ හඬ නඟමින් හේ නැගිටියේ ය. ඉක්බිති පණ දුන් සොරා වැලඳ-ගෙන, ඔහුට පින් දී, 'අනේ ඔබ නිසා මා ආයෙත් මේ ලෝකයට ආවා. ඔබට දිව සැපත් ලැබේ වා' යි කියමින් කඳුළු වගුරුවමින් හඬන්නට වී ය.

'ඉතින් කොහි ද යන්නේ' යි සොර දෙටුවා ඇසී ය. 'වෙන කොහි යන්නට ද? මා ගෙදර යනවා. ඔබට පින් සිදු වුණා වේ' යනු කිරි හාමි කී ය. 'හා, හා, වරක් මැරී ඒ ගෙදරට ම යන්නට හොඳ නැ. අප එක්ක යමු' යි පණ දුන් සොරා පැවැසී ය. 'අනේ, කියන තැනකට එනවා; නරකාදි වුණත් එනවා, එනවා ම යි. මගේ පණ ඔබේ නො වේ ද' යි කියමින් කිරි හාමි යළිත් අඬන්නට වූයේ ය.

සොරු කිරි හාමි සනසා, ඔහුගේ ඇඟේ වැලි පිස-දමා, ඔහු එක් කැර-ගෙන යන්නට වූ හ. මඟ දී, කිරි හාමි තමා ගේ සියලු තොරතුරු කියමින් සොරුන් සතුටු කෙළේ ය. 'අමාරු වූ තැනෙක දී යස බිල්ලක්, අගේ ඇති බිල්ලක්' යි කියමින් සොරු සිනා සුණෝ ය.